# සොළොස් ආකාර ක්ලේෂ ධර්මයන් විවරණය කරන වත්ථූපම සූත්‍රය

*- හෝමාගම ධම්මානන්ද හිමි -*

## 1.1 සූත්‍ර සාරය :-

බුදුරජාණන් වහන්සේ වස්ත්‍රයක් උපමාවට ගෙන පුද්ගල මනස, මිනිස් සිත කිළිටි වන ආකාර සහ එම කිළිටි මනසේ ආදීනවත්, පුද්ගල මනස පිරිසිදු වන ආකාර සහ එම පිරිසිදු මනසේ ආනිසංසත් ගෙනහැර දක්වමින් සැවැත් නුවර ජේතවන විහාරයෙහි වැඩසිටි අවස්ථාවක භික්ෂූන් උදෙසා වත්ථූපම නම් වූ මෙම සූත්‍රය වදාළහ.[1]

1.2 කිළිටි, කුණු වැකුණු වස්ත්‍රයක් නිල්, කහ, රතු හෝ වෙනත් පාටකට, වර්ණයකට හැරවුවහොත් (පඬුපොවන්නේ නම්) වස්ත්‍රය අපිරිසිදු නිසා අපිරිසිදු පාට ගන්නක්, අවපාට ගන්නනක්, හෙවත් දුර්වර්ණ ගන්නක් වේ. එසේම සිත කිළිටි වූ පසුත් බලාපොරොත්තු විය යුත්තේ, අපේක්ෂා කළ යුත්තේ දුගතියක් ම ය.[2]

1.3 පිරිසිදු වස්ත්‍රය නිල්, කහ, රතු හෝ වෙනත් පාටකට, වර්ණයකට හැරවුවහොත්, වර්ණ ගැන්වුවහොත්, එය බබළන පාටින් යුතු වන්නාක් මෙන් සිත පිරිසිදු වූ විට සුගතියක් බලාපොරොත්තු විය යුතුය.[3]

1.4 සිත කිළිටි කරන, අපවිත්‍ර කරන, කෙලෙසන, ක්ලේෂ ධර්ම රාශියකි.[4]
1. අභිජ්ඣා විෂම ලෝභය 2. ව්‍යාපාදය 3. ක්‍රෝධය 4. බද්ධ වෛරය 5. ගුණමකු බව 6. පලාසය 7. ඊර්ෂ්‍යාව 8. මසුරුකම 9. මායාව 10. කපටිබව 11. ථම්භය 12. සාරම්භය 13. මානය 14. අතිමානය 15. මදය 16. ප්‍රමාදය යනු ඒවාය. මේවා සිත කිළිටි කරන ධර්ම බව දැන

ඒවා සිතින් ඉවත් කිරීමට භික්ෂුව කටයුතු කළ යුතුය. එවිට ඒ භික්ෂුව බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදු ගුණ දැන පහදී. එසේ ම ධර්මය ස්වාක්ඛාතාදී ගුණවලින් යුතු බව දැන ධර්මයෙහි පහදී. ශ්‍රාවක සංඝයාගේ සුපටිපන්නාදී ගුණ දැන පහදී. ඒ භික්ෂුවගේ කෙලෙස් ඉවත්වී බැහැරවී, මිදී, ප්‍රහීනවී, දුරු වූ කල 'මම බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වෙමි.' යි කියා ගුණ දැන උපදින සතුට වූ අත්ථවේදය ලබයි. සොම්නසින් උපන් ඤාණය වන ධම්මවේදය ලබයි. සතුටින් හා නුවණින් යුතු ප්‍රමෝදය ලබයි. ප්‍රමෝද වූ තැනැත්තාට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තාගේ කය සන්සිඳෙයි. සන්සිඳුණු කය ඇත්තා සුව විඳියි. සුව ඇත්තාගේ සිත එකඟව සමාධිගත වේ.

1.5 මෙබඳු වූ සිල්, දහම්, නුවණැති ඒ අනාගාමි භික්ෂුව නොයෙක් සූපව්‍යඤ්ජන ඇති පිරිසිදු ඇල්හාල් බත් වළඳයි ද? එය ඔහුට මාර්ගඵල ලබා ගැනීමට බාධාවක් නොවේ. ඒ භික්ෂුව සිව් දිසාවේත්, උඩ, යට, සරස, යන හැම තැනමත් සියල්ලන් තමන් හා සම කොට ගනිමින් සියලු සතුන් ඇති ලොව විශාල වූ මහත් බවට පැමිණි අප්‍රමාණ වූ අවෛරයෙන් අව්‍යාපාද වූ මෛත්‍රී සහගත සිත පතුරුවා වාසය කරයි. ඒ අයුරින් ම කරුණා සහගත සිත්, මුදිතා සහගත සිත්, උපේක්ෂා සහගත සිත්, පතුරුවා වාසය කරයි.

1.6 ඒ භික්ෂුව මේ දුක්ඛ සත්‍ය ඇත. හීන වූ සමුදය සත්‍ය ඇත. උතුම් වූ මාර්ග සත්‍ය ඇත. මේ බ්‍රහ්මවිහාරයට වඩා උතුම් නිවනක් ඇතැයි දැනගනියි. මෙසේ දන්නා වූ දක්නා වූ ඔහුගේ සිත කාමාශ්‍රවයෙන්, භවාශ්‍රවයෙන්, අවිද්‍යාශ්‍රවයෙන් මිදෙයි. මිදුණු පසු මිදුනේ යැයි ඥානය පහළ වෙයි. වෙනත් කළ යුත්තක් නැත. බඹසර වැස කළයුතු ජාතිය ක්ෂය කිරීම කරන ලදැයි දැන ගනී. 'මේ භික්ෂුව තෙම ඇතුළත නෑමෙන් ස්නානය කළේ යැයි කියනු ලැබේ.'[6] මේ අසළ සිටි සුන්දරික භාරද්වාජ බමුණා 'භගවත් ගෞතම තෙමේ බාහුකා නදියට නෑම පිණිස යේ දැයි' ඇසීය.[7] 'බාහුකා නදිය කුමක් කරයිද? ඒ නදියෙන් ඇති ප්‍රයෝජන කවරේදැයි බුදුහු ඇසූහ. ගෞතමයෙනි, බාහුකා නදිය කළ පව් සෝදා හැර පිරිසිදු බව ලබා දෙන බව බොහෝ දෙනාගේ සම්මතය[8] යැයි කීය.



1.7 බාහුකා නදිය, අධිකක්ඛ නම් තීර්ථය, ගයා තීර්ථය, සුන්දරික නදිය, සරස්වතී නදිය, ප්‍රයාග තීර්ථය, බාහුමතී නදිය, කළ පව් ඇති නුවණැති මිනිසා පිරිසිදු නොකරයි. කෙලෙස් නැතිකොට පිරිසිදු වූ තැනැත්තාට හැමකල්හිම උතුරුපල්ගුණ නැකත වේ. හැමකල්හිම පෝය වේ. පිරිසිදු කර්ම ඇත්තාගේ ව්‍රතය හැම කල්හිම සමෘද්ධ වේ. බමුණ මේ සසුනෙහි කෙලෙස් සොදා නාගන්න. සියලු සතුන් කෙරෙහි මෙත් පතුරු වන්න. බොරු නොකියන්න. සතුන්ට හිංසා නොකරන්න. ශ්‍රද්ධාව ඇතිව මසුරු නොවේ නම් ඔබගේ ළිඳම ගයාව වේ. සුන්දරිකභාරද්වාජ බමුණා තෙරුවන් සරණ ගොස් පැවිදිව උපසම්පන්නව නොබෝ කලකින් රහත් විය.

## ධර්මාර්ථ විශ්ලේෂණය

2.1 වස්ත්‍රයන්ට වර්ණ ගන්වන (පඬුපොවන) කෙනෙකු වර්ණ ගැන්වීම කරනු ලබන්නේ දෙන ලද කිසියම් වස්ත්‍රයකට මනා පැහැයක්, අලංකාරයක් ලබාදීමේ අරමුණෙනි. එනම් ලස්සන, සිත් කාවදින, මනස්කාන්ත වස්ත්‍රයක් නිර්මාණය කිරීම පිණිසය. මෙම අරමුණ ඉටුකර ගැනීම පිණිස වස්ත්‍රයන්ට වර්ණ ගන්වන තැනැත්තා (රජකෝ) පළමුව වස්ත්‍රය පිරිසිදු කළ යුතුය. වස්ත්‍රයේ පවිත්‍රතාවය එයට ගල්වන වර්ණ වඩාත් පහසුවෙන් උරාගැනීමටත් එය වඩාත් දීප්තිමත් වීමටත් මූලික සාධකය වේ. වර්ණ ගන්වන තැනැත්තාට වඩා සතුටු විය හැක්කේ වර්ණ ගැන්වීමෙන් පසු තමන් අපේක්ෂා කළ දීප්තිමත් භාවය එම වස්ත්‍රයෙන් පෙන්නුම් කරන්නේ නම් පමණි. වස්ත්‍රයට වර්ණ ගැන්වූ පසු එය වඩාත් දීප්තිමත් භාවයට පත් වන්නේ අදාල වර්ණ මනාව සහ උපරිම වශයෙන් වස්ත්‍රයට උරාගතහොත් පමණි. වස්ත්‍රයට උපරිම වශයෙන් එම වර්ණ උරාගත හැකි වන්නේ වස්ත්‍රය කෙතෙක් දුරට පිරිසිදුව පවතින්නේද? යන කාරණය මතය. මේ අනුව වස්ත්‍රයකට පඬු පෙවීමේ ක්‍රියාවලිය සාර්ථක වීමේ රහස වන්නේ වස්ත්‍රයේ පිරිසිදු භාවයයි යන්න ඉතා පැහැදිලිය.

2.2 අනෙක් අතට වර්ණ ගන්වනු ලබන වස්ත්‍රය අපිරිසිදු නම්, කිළිටි නම් එයට ගන්වනු ලබන වර්ණවලට කුමක් සිදුවේද? එය ඉතා පැහැදිලිය. එනම් එය මුළුමනින් ම දුර්වර්ණ වස්ත්‍රයක් බවට පත් වේ. වස්ත්‍රය එසේ දුර්වර්ණ වන්නේ වර්ණ ගන්වන්නාගේ වරදක් නිසා නොව වස්ත්‍රයේ පැවති අපවිත්‍රතාවය නිසාය. දැළි කුණු ආදිය තැවරුණු වස්ත්‍රයක් නිසාය.

2.3 වස්ත්‍රයකට වර්ණ ගැන්වීමේ මෙම ක්‍රියාවලිය උපමාවක් ලෙස ගෙන බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රය දේශනා කරමින් පෙන්වා දෙන්නේ කිළිටි වූ, අපවිත්‍ර වූ, කෙලෙස් සහිත වූ, මනස නිසා පුද්ගලයා දුගතියට පත් වන බවත්, දුගතිය ම අපේක්ෂා කළ බවත්ය. එසේ ම පවිත්‍ර වූ, පිරිසිදු වූ, කෙලෙස් රහිත වූ මනස නිසා පුද්ගලයා සුගතියට පත් වන බවත්, සුගතියම අපේක්ෂා කළ යුතු බවත්ය. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් පුද්ගල මනස ව්‍යාකුලත්වයට පත් කරන ලෝභ, ද්වේෂ, මෝහ, මද, මාන, ඊර්ෂ්‍යා, ක්‍රෝධාදී කෙලෙසුන්ගෙන් පිරුණු සිතින් යුතුව, සිතන සිතුවිලි, ප්‍රකාශිත වචන, සහ කරන ක්‍රියා අපවිත්‍ර, අපිරිසිදු වන අතර ඒවායෙහි ප්‍රතිඵල ද දුක් සහිත, පීඩා සහිත වන්නා සේ ම ඒ හේතුව නිසා ඔහු අපායගාමී වන බවත් මෙම ක්ලේෂ ධර්මයන්ට ප්‍රතිවිරුද්ධ අලෝභ, අද්වේෂ, අමෝහාදී කුසල මූලයන්ගෙන් ප්‍රභාමත් වූ සිතින් යුතුව සිතන සිතුවිලි, ප්‍රකාශිත වචන සහ කරන ක්‍රියා පිරිසිදු, පවිත්‍ර වන අතර ම එහි ප්‍රතිඵල ද සැප සහිතය. සොම්නස් පිණිස පවතින අතර ම, එනිසාම මරණින් මතු ද සුගතිගාමී වන බව මෙයින් ප්‍රකාශිතයි

2.4 පුද්ගල මනස කිළිටි කරන, අපවිත්‍ර කරන සිතුවිලි මොනවාද? ආරම්මණ මොනවාද? යන්නත්, මනස පවිත්‍ර කරන, පිරිසිදු කරන සිතුවිලි ආරම්මණ මොනවාද? යන්නත් මෙම සූත්‍රය පුරා විවරණය කර තිබේ. ඒ අනුව සෘජුව ම පුද්ගලයා විමුක්තියට, නිවණට යොමුකරමින්, පවිටු චේතනාවන්ගෙන් විනිර්මුක්තව සිත සකස් කර ගැනීමේ පිළිවෙත උගන්වන ලද සූත්‍රයක් ලෙස මෙම සූත්‍රය මූලික වශයෙන් හඳුන්වා දිය හැකිය. මෙසේ සිත, මනස කිලුටෙන් ඉවත් කොට යහපතෙහි පිහිටුවා



ගැනීම පිණිස බාහිර කිසිදු දෙයක් හෝ පුද්ගයෙකුගේ පිහිට නොපැතිය යුතු බව ද එසේ කරගැනීමේ ශක්තිය තමා තුළ පවත්නා බව ද² වැඩිදුරටත් මෙයින් අවධාරණය කරයි.

2.5 බුදුරජාණන් වහන්සේගේ දේශනා කෞශල්‍ය මැනවින් ප්‍රකට වන දේශනාවක් ලෙස වත්ථූපම සූත්‍රය නම් කළ හැකිය. උන්වහන්සේ බොහෝ අවස්ථාවල ධර්මදේශනා පවත්වන්නේ සරල, සුගම සහ ජන ව්‍යවහාරයට සමීප උපමා රූපක යොදා ගනිමිනි. (සරල උපමා රූපක භාවිතය පිළිබඳ ධම්මපද පාලිය කදිම නිදසුනකි) එමගින් අතිශය සංකීර්ණ සහ ගැඹුරු ධර්ම කරුණු පවා ශ්‍රාවකයාට පහසුවෙන් අවබෝධ කර ගැනීමේ ඉඩ අවකාශ සැලසී ඇත. සූත්‍ර පිටකයේ පමණක් නොව විනය පිටකයේ බොහෝ තැන්වල ද මෙම ලක්ෂණය අපට හමුවේ.

2.6 සිතේ ස්වභාවය විවරණ කෙරෙන මෙම සූත්‍රය සමස්ත බුද්ධ දේශනාවේ මුඛ්‍ය පරමාර්ථය විදහා දක්වන්නක් ලෙස විවරණය කළ හැකිය. බුදුරජාණන් වහන්සේ දහම් දෙසන්නේ තමන් අත්විඳි දෙය ශ්‍රාවකයාට ලබා දීමේ අරමුණෙනි. 'ගිහිවෙස්න මෙසේ විමුක්ත සිත් ඇති මහණ ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ සිවුසස් දක්නාහු අනුන් දක්වනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ ඉන්ද්‍රිය දමනයෙන් දැමුණුහු අනුන් දමනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ කෙලෙසුන්ගේ ක්ෂෝභ සන්හිඳුවාලුවාහු අනුන්ගේ ක්ලේශ ක්ෂෝග සන්සිඳවනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහනසේ තුමූ තැරුසසරසයුරු ඇත්තාහු අනුන් සසරසයුරින් කරනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ කෙලෙස් පිරිනිවෙනින් පිරිනිවියාහු අනුන්ගේ කෙළෙස් ගිනි නිවනු සඳහා දහම් දෙසති' යි භාග්‍යවත් හට ම සත්කාර, ගරුකාර, මානන, පූජන කෙරෙතියි වදාළහ.[10]

2.7 සම්බුද්ධත්වයට පත්ව පස්වග තවුසන් උදෙසා කළ ප්‍රථම දේශනාවේ සිට පන්සාලිස් වසක් අවසන කුසිනාරාවේ පරිනිර්වාණ මංචකය දක්වා කළ සියලු දේශනාවන්ගේ මූඛ්‍ය පරමාර්ථය වූයේ කෙලෙස් මළින්

02 MAY 2012

වැසීගත් පුද්ගල මනස කෙළෙස් මළ සෝදා සුවපත් කිරීමය. එය සියලු බුදුවරුන්ගේ ම එක ම අරමුණ, අභිප්‍රාය බව ද පැහැදිළිය. සියලු බුදුවරුන්ගේ අනුසාසනාව වූයේ සියලු පව් නොකිරීම, කුසල් ඉපදවීම, සහ ස්වකීය චිත්ත දමනයයි.[11]

2.8. පුද්ගලයාගේ පිරිසිදු අපිරිසිදු බව ඇති වන්නේ බාහිර භෞතික බවින් නොවන බව මෙම සූත්‍රය අවධාරණය කරයි. සූත්‍රය අවසානයේ සුන්දරික භාරද්වාජ බමුණාගේ ප්‍රශ්නවලට සහ ප්‍රකාශනවලට පිළිතුරු සපයමින් බුදුරජාණන් වහන්සේ ඒ බව මෙසේ අවධාරණය කළහ. 'බාහුකා නදියට ද අධිකක්ඛනම් තීර්ථයට ද ගයා තීර්ථයට ද..... කළ පව් ඇති අඥානතෙමේ.... පාප කර්මයෙන් යුක්ත ඒ නුවණ නැති මිනිසා පිරිසිදු නොකෙරෙත්[12] යනුවෙන් වදාළේ විශුද්ධත්වය අභ්‍යන්තරික වශයෙන් ඇතිවන්නක්, ඇතිවිය යුත්තක් බව අවධාරණය කරමිනි. පුද්ගලයා කෙලෙසෙන්නේ යැයි හෝ පිරිසිදු වන්නේ යැයි අප කථා කරන විට එයින් ගම්‍ය වන්නේ පුද්ගලය මනසය. එනම් මනස තුළ හෙවත් සිතේ ජනිත වන චෛතසිකවල ස්වභාවය මතයි. පුද්ගලයාගේ පිරිසිදු අපිරිසිදු භාවය මිණිය හැක්කේ.

2.9 සම්මුති වශයෙන් විද්‍යමාන පුද්ගලයාට (යථාර්ථමය වශයෙන් හෙවත් පරමාර්ථමය වශයෙන් ගත් කල සත්ව පුද්ගල වශයෙන් ගතහැකි කිසිවක් නැතිබව බුදු දහම උගන්වයි) ෂඩින්ද්‍රියක් ඇත. (චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන) භෞතික වශයෙන් අවිද්‍යමාන වුවද අසවල්තැන පවතින්නේ යැයි පෙන්විය නොහැකි වුවද[13] අනෙකුත් සියලු ඉන්ද්‍රියයන්ට වඩා වැදගත් වන්නේ සහ ප්‍රබල වන්නේ මනිද්‍රියයි. පුද්ගල ක්‍රියාකාරිත්වයෙහි තීරක සාධකය ලෙස හෙවත් පුද්ගල ක්‍රියාකාරිත්වයන් සියල්ල මෙහෙය වන්නා ලෙස මනස හඳුන්වාදිය හැකිය.[14] එම නිසා බුදු දහම මුළුමනින් ම වෙර දරන්නේ, මග පෙන්වන්නේ මනසේ දුබලතා මෙන් ම ශක්තීන් විවරණය කොට මනස හැදීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමටය.



2.10 පුද්ගලයා හැදීම යනු පුද්ගල මනස හැදීමයි. හැනු මනසක් ඇති පුද්ගලයා හැම අතින් ම පිරිපුන්ය. නිවී සැනසී පහන්වී ගිය අයෙකි. ඔහුගෙන් සමාජයට කිසිවිට අවැඩක් සිදු නොවේ. ඔහු අපේක්ෂිත පරමාර්ථය කරා යොමු කරවීම ඉතා පහසුය. මෙහි පුද්ගල මනස හැනීම යනු අන්කවරක්වත් නොව පවින්, අවැඩෙන්, අකුසලයෙන් වෙන් කොට කුසලයෙහි, යහපතෙහි යොදවමින් සිත හික්මවීමයි. පුද්ගල මනස කෙළෙසන, දූෂිත භාවයට පත් කරන චෛතසික ධර්ම පිළිබඳව පැහැදිලි විවරණයක් වත්ථූපම සූත්‍රය ඉදිරිපත් කරයි.

**සිත කෙළෙසන චෛතසිකයෝ**

3.1 **අභිජ්ඣා විසමලෝභ** :- අභිජ්ඣා විසමලෝභ යනු ලෝභය යි. ආරම්මණ හෙවත් විෂය වස්තූන් ලෙස ගත් කල එක ම ලෝභය දෙයාකාරයක් ගනී. ඒ අනුව අභිජ්ඣාව එකකි. විෂම ලෝභය තව එකකි. අභිජ්ඣාව නම් තමාගේ සන්තකය පිළිබඳ ඇති ආශාව, කැමැත්ත, ආදරය, තණ්හාව යන්න වන අතර විෂම ලෝභය නම් අන් සන්තකය (තමා අයත් නොවූ දේ) කෙරෙහි පවත්නා ආශාව, කැමැත්ත, ආදරය, තණ්හාව යන්නයි.

3.2 **ව්‍යාපාදය** :- සරලව ගත් විට මෙහි මූලික අදහස වන්නේ අනුන් නැසෙත්වා, වැනසෙත්වා යන හැඟීමයි. තමාගේ සතුරා කෙරෙහි මානසික වශයෙන් හට ගන්නා මෙම ව්‍යාපාදය නව අසාත වස්තුව ලෙස ද හැඳින්වේ. එනම් තමන්ගේ සතුරා තමන් කෙරෙහිත්, තමන්ගේ අඹුදරු යහළු මිත්‍රයන් කෙරෙහිත් වරද කළේය, කරන්නේය, අනාගතයේ ද කිරීමට ඉඩ ඇත යන හැඟීමත්, තමන්ගේ සතුරන්ට අනුබල දෙමින් තුන් කල්හි ක්‍රියා කරන්නේය, යන හැඟීමත් යන නව ආකාරයක ක්‍රියාකලාපය, නව ආසාත වස්තුව ලෙස හැඳින්වේ. මෙහිදී සතුරා විනාශ කිරීමේ ක්‍රියාදාමයකට යොමු නොවන අතර, මානසික වශයෙන් ඇති කර ගන්නා හැඟීම් පමණක් ව්‍යාපාද ලෙස ගැනෙන බව සඳහන් කළ හැකිය.

3.3 **ක්‍රෝධය** :- ක්‍රෝධය නම් කිපීමයි. අරමුණ හා නිරන්තරයෙන් පවත්නා ගැටීම, නොරුස්නා ගතිය ලෙස මෙය හැඳින්විය හැකිය. ක්‍රෝධයේ ස්වභාවය උදාහරණයකින් දක්වා ඇත්තේ දණ්ඩෙන් පහර කෑ සර්පයෙකු මෙන් පවත්නා ගතියක් ලෙසය. පුද්ගල අභ්‍යන්තරයේ හට ගන්නා මෙම චෛතසිකය නිසා පුද්ගලයාගේ බාහිර ස්වරූපය විකෘති වේ. ක්‍රෝධ සිත අභ්‍යන්තරයෙහි බලපවත්නා විට පුද්ගලයා මුළුමනින් ම වෙනසකට භාජනය වන අතර, එවැනි අවස්ථාවක තමාට තමාව පාලනය කරගත නොහැකි තත්වයට ද පුද්ගලයා පත් කරනු ලබයි.

3.4 **උපනාහය** :- මෙය බද්ධ වෛරය ලෙස ද හැඳින්වේ. ක්‍රෝධය හටගත් සිතෙහි ම තවත් එක් අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකිය. අරමුණ අවිද්‍යමාන වීම නිසා හෝ තමා අදාළ සන්දර්භයෙන් බැහැර වීම නිසා ක්‍රෝධය සිතෙන් ඉවත් වේ. සමහර විට එය මුළුමනින් ම සිතින් බැහැර වන අතර සමහර විට අරමුණ හා නැවත ගැටීම නිසා සිත්හි හටගන්නා තත්වයෙන් සංසිඳී යයි. මෙසේ නැවත නැවත එකම අරමුණක් නිසා සිතෙහි හට ගන්නා ක්‍රෝධය ම උපනාහය ලෙස හෙවත් බද්ධ වෛරය ලෙස හැඳින්විය හැකිය.

3.5 **මක්ඛය** :- මක්ඛය නම් මකු බව හෙවත් ගුණමකු බවයි. පෙර කළ උපකාර නොසලකා හැරීම හෙවත් තමන්ගේ දියුණුවට අන්‍යයන් දක්වන ලද සහයෝගය අවතක්සේරු කිරීම නොසලකා හැරීම හෝ අවලංගු කර දැමීම මෙහි මූලික ලක්ෂණ යයි. මේ අදහස සිත්හි බලපවත්නා පුද්ගලයා දැඩි ආත්මාර්ථකාමී පුද්ගලයෙකි. ඔහු කිසිවිටෙක කිසිදු ආකාරයකින් කෘතවේදී ගතිය නොපෙන්වයි. (කතඤ්ඤූ කතවේදී) සියල්ල තමන්ගේ ධෛර්ය හා ශක්තිය මෙන් ම කැපවීමෙහි ප්‍රතිඵල ලෙස සාධාරණීකරණය කර ගනී. අනුන් තමන්ට කළේ කුමක්දැයි තමන්ගෙන් ම ප්‍රශ්න කර, කළ උපකාරය පවා තමාගේ වාසියට හරවා ගෙන අනුන් අමතක කර දමයි.



3.6 **පලාසය** :- කුමන ආකාරයකින් වුවද කිසිවකුට තමාව ඉක්මවා යා නො හැකිය. යන හැඟීම හෙවත් ගුණ නුවණින් හෝ ක්‍රියාකාරකම්වලින් හෝ දස්කම්වලින් හෝ විශේෂතාවන් දක්වන ඕනෑම කෙනෙකු ඍජුව හෝ වක්‍රව තමා හා සමකොට සැලකීම මෙයින් අදහස් කෙරේ. සංක්ෂිප්ත වශයෙන් දක්වන්නේ නම් කුමන ආකාරයකින් හෝ තමාට වඩා උසස් අයෙකු සිටිය නොහැකිය යන අදහස පලාස යයි.

3.7 **ඉස්සා** :- ඉස්සා යනු ඊර්ෂ්‍යාවයි. තමන්ට නොමැති සැපතක් හෝ ලාභයක් අනුන් කෙරෙහි පවතිනවාට ඇති නොකැමැත්ත ඊර්ෂ්‍යාව නම් වේ. අනුන්ගේ සැපත නොරුස්නා බව මෙයින් කියවේ. මෙය භෞතික වශයෙන් පවත්නා ද්‍රව්‍යාත්මක ලාභ ප්‍රයෝජන කෙරෙහි පමණක් නොව අන්‍ය වූ අභෞතික දේ කෙරෙහි ද බලපවත්වයි. එනම් අන්‍යයන්ගේ නිරෝගිකම, සතුට වැනි දේ ද නොඉවසීම වේ. අනුන්ගේ ගරුබුහුමන් කීර්ති ප්‍රසංසා ආදිය ද එසේමය. තමන් නොකැමැත්තන්, තමන් නොරුස්නා පුද්ගලයන් සැපතින් යසසින් කීර්තියෙන් පිරිහෙන්නේ නම් එහිදී මෙවැන්නෝ වඩාත් සතුටු වෙති. අනුන්ගේ කුමන හෝ සතුටක් නොඉවසන ගතිය ඊර්ෂියාව ලෙස සිතෙහි ක්‍රියාත්මක වන බව මෙයින් පෙනී යයි.

3.8 **මච්ඡරිය** :- මච්ඡරිය නම් මසුරුකමයි. මෙය ලෝභය ම නොවේ. එය ඉක්මවා ගිය තත්වයකි. ධර්මතාවයකි. ලෝභී පුද්ගලයා තමන්ගේ සන්තකය අනුන්ට දීමට අකමැති වුව ද අනුන් තමන්ගේ සන්තකය දැකීම කෙරෙහි අකමැත්තක් නැත. සමහරවිට තමාගේ සන්තකය අනුන්ට පෙන්වා එයින් සියුම් සතුටක් පවා ලැබීමට ලෝභී පුද්ගලයා පෙළඹේ. එසේ ද වුවත් මසුරා තමාගේ සන්තකය අනුන්ට දීමට තබා ඒවා අන්‍යයන් දකිනවාට ද අකමැතිය. (මට්ටකුණ්ඩලී සිටු පුත්‍රයාගේ කතා පුවත මෙයට කදිම නිදසුනකි) තමාගේ සන්තකය අනුන් දැකීම පවා තමාට හානිකර වන බව ඔහු කල්පනා කරයි.

3.9 මායාව :- මායාව නම් මුලාවයි. රැවටීමයි. බාහිර සමාජයට තමාගේ සැබෑ ස්වභාවය නොපෙන්වා කටයුතු කිරීමට උත්සාහ කිරීම මෙයින් අදහස් කෙරේ. එනම් තමන් කරන වැරදි සමාජයට ප්‍රකට නොවන ලෙස සිදුකර ඉතා ම නිවැරදි පුද්ගලයෙකු ලෙස සමාජය ඉදිරියේ පෙනී සිටීමයි. මෙය අතිශයින්ම හානිකර සංකල්පයකි. මක්නිසාද මේ සිතුවිල්ල නිසා එම පුද්ගලයා වැරදි කිහිපයක් සිදු කරන බැවිනි. අදාළ වැරදි ක්‍රියාවෙහි යෙදීම එකකි. එය සමාජයට හෙළි නොවන පරිදි සමාජයෙන් වසන්කොට සමාජය මුලාකොට සඟවා තබා තමන් නිවැරදි කෙනෙකු ලෙස පෙනී සිටීම තව එකකි. මෙයින් සිදු වන්නේ අප, අපවම වංචා කර ගැනීමකි.

එසේ ද වුවත් කිසිවකුට තමන්ට නොදැනුවත්ව කිසිදු වරදක් කළ නොහැකිය. අප හෘද සාක්ෂිය ලෙස හඳුන්වන්නේ එයයි. ක්‍රියාවන්ගේ ඵලය විනිශ්චය කරනු ලබන්නේ, බාහිර පුද්ගලයෙකු හෝ ශක්තියක් විසින් නොව (නිර්මාණවාදී දේව සංකල්පය පිළිගන්නා ආගමික ඉගැන්වීම් පෙන්වා දෙන්නේ සර්වබලධාරී දෙවියන් වහන්සේ විසින් අවසාන විනිශ්චය සිදු කරන බවයි.) තමාගේ ම හෘද සාක්ෂියට අනුව සිදු කරන හොඳ හා නරක දේට අනුරූපවය. එබැවින් මායාවෙන් මුලා කරන්නේ සමාජය වුවත් අවසානයේ දී තමා ම මුල වී ඇති බව වැටහෙනු ඇත.

3.10 කපටිබව :- කපටිබව නම් නැති ගුණ ප්‍රකාශ කරමින් හිතෛෂී භාවය හා පක්ෂපාති භාවය පෙන්වමින් තමාගේ අවශ්‍යතා සපුරා ගැනීමට අන් අය මුලාවට පත් කරන ගතියයි. එහෙත් මෙය මායාව නොවන බව සැලකිය යුතුය. කෛරාටික බව ලෙස ද මෙය හඳුන්වයි. මෙහි අරමුණ වන්නේ තමන්ට අන්‍යයන්ගෙන් ලාභ ප්‍රයෝජන ලබා ගැනීමයි. එහිදී ඉතා නිවට ලෙස අනුන් ඉදිරියේ හැසිරීමට පවා මොහු පෙළඹේ. එසේ කරන්නේ අනුන්ගේ සිත් දිනා ගැනීමේ අදහසිනි. අන්‍යයන්ගේ සිත් තුළ තමා කෙරෙහි දැඩි විශ්වසනීයත්වයක් ඇති කිරීමෙනුත් තම අපේක්ෂා මුදුන් පත් කර ගැනීමට කෛරාටික චේතනාව,



පුද්ගල මනස තුළ ඉතා සූක්ෂම ලෙස ක්‍රියාත්මක වේ. එය ඉතා දීර්ඝකාලීන සැලසුම් ලෙස ක්‍රියාත්මක වන අවස්ථා ද අපට දැකගත හැකිය. ගිහි පැවිදි කා අතරත් බහුල වශයෙන් ක්‍රියාත්මක වන, සිත දූෂිත භාවයට පත් කරන චෛතසිකයක් ලෙස මෙය දැක්විය හැකිය.

3.11 ථම්භය :- ථම්භය නම් තද ගතියයි. නොනැමෙන ගතියයි. අප අකීකරු ගතිය, මුරණ්ඩු ගතිය ලෙස හඳුන්වන්නේ මෙයයි.ථම්භ නම් වූ චෛතසිකය බල පවත්වන සිත ඕනෑම වරදකට පෙළඹිය හැකිය. සිදුකරන ක්‍රියාවෙන් කුමන ආකාරයේ අවඩැක්, අනර්ථයක් සිදු වුව ද තමා ආශා කරන දෙය හෙවත් රුචි කරන දෙය ලබනු පිණිස එය සිදු කිරීමට සිත පෙළඹේ. කිසිවෙකුගේ අවවාදයක් පිළිනොගැනීම මෙහි මූලික ලක්ෂණයයි. යුක්තිය, ධර්මය, නීතිය, සදාචාර මේ කිසිවක් පිළිබඳ පුද්ගලයා අල්පමාත්‍ර තැකීමක් නොකරන්නේ මේ සිතුවිල්ලෙහි තිබෙන තද ගතිය නිසාය. මෙහි පවත්නා භයානකකම වන්නේ පුද්ගලයාත්, සමාජයත් මහත් වූ විනාශයකට මේ නිසා පත්විය හැකි බවයි.

3.12 සාරම්භය :- සාරම්භය කුසල හා අකුසල වශයෙන් දෙයාකාරය. මෙහි ගැනෙන්නේ අකුසල බවයි. සාරම්භය යන්නෙහි මූලික අදහස සමාජයේ අන් අය කරන, කියන, සිතන, පතන දේවල් දෙස බලා ඒවා එලෙස ම අනුකරණය කිරීම සහ සමහරවිට ඒවාටත් වැඩියෙන් යමක් කිරීමට ඇති කැමැත්තයි. විශේෂයෙන් තමන් අකමැති පුද්ගලයන් සහ සම්පත් අධික පුද්ගලයන් සිදු කරන දේවල් දෙස බලා ඒවා ඉක්මවා ගොස් සිදු කිරීමේ චේතනාව, ඒවා ලබා ගැනීමට තිබෙන චේතනාව, ඒවා අභිබවා යාමේ චේතනාව මෙයයි.

මිනිස් සමාජය තුළ අපට අධික වූ සංකීර්ණ ගැටළුවලට මුහුණ දීමට සිදුවී තිබෙන්නේ මෙම අකුසල චේතනාව නිසාය. තමන්ගේ සැබෑ ස්වභාවය, තත්වය ගැන නොතකා කටයුතු කිරීමට යාමෙන් අවුල් සහගත මානසිකත්වයක් ඇති වීමත්, බරපතල සමාජ ගැටළුවලට මුහුණ දීමට සිදුවීමත් වැළැක්විය නොහැකිය. මිනිස් ජීවිතවල හිටිහැටියේම

සිදුවන මහා කඩා වැටීම්වලට මූලික ම සාධකය වන්නේ සාරම්භ යයි. මේ සිතුවිල්ල නිසා සිදු වන්නේ සත්සුත් වූ මිනිස් ජීවිතයක පැවතිය යුතු ඉතාම වැදගත් ගුණාංගයන් වන යථාලාභ සන්තෝෂය, සැහැල්ලුබව, සුභර බව නැතිවී යාමයි.[15] එමනිසා සමස්තයක් ලෙස මුළු මහත් සමාජය ම අතෘප්තිකර බවකින් පීඩාවට පත්වේ. තණ්හාවට දාස වූ පෘථග්ජන පුද්ගලයා ස්වභාවයෙන් ම අතෘප්තිකර ජීවිතයක් ගත කරන්නෙකි.[16]

3.13 මානය :- මානය නම් මැනීමයි. සැසඳීමයි. තමාගේ ස්වභාවය අන්‍යයන් හා සසඳා බැලීම මෙයින් අදහස් වේ. මෙම මිණිමේ කාර්යය සඳහා විවිධ දේ ඉදිරිපත් වේ. ධනය, කුලය, බලය ආදිය හා පෞද්ගලික වූ තමාගේ දක්ෂ පක්ෂ කම් ආදිය ද මේ අතර විශේෂ වේ. මෙසේ ඇතිවන මානය තෙයාකාර ය. හැම අතින්ම තමා උසස්ය, අනුන් පහත් යැයි කරන මැණීම සෙයා මානයයි. කොයි අංශයෙනුත් තමන් අනුන් හා සම කොට සැලකීම සදිස මානයයි. තමා අන්‍යයන් අතර පහත් යැයි ඇති වන හැඟීම හීන මානයයි. මෙයින් අතිශය වරද සහගත සෙයා මානය සහ සදිස මානය යි. එයින් සිදුවන බරපතලම දුර්වලතාවය වන්නේ පුද්ගලයා මුලාවට පත්ව අන්ධ භාවයෙන් තමාට නැති තත්වයක් ආරූඪකරගෙන කටයුතු කිරීමයි. පුද්ගලයාට තමාව තමාට හඳුනාගත නොහැකි තත්වයට පත්වන්නේ මේ චෛතසිකය නිසාය. හීන මානය ද සිතේ බලපැවැත්විය යුත්තක් නොවේ. එයින් සිදුවන්නේ තමාගේ තත්වය හරිහැටි තක්සේරු කරගත නොහැකි වීමයි.

3.14 අතිමානය :- මානය මිණීමයි. අතිමානය නම් තමන් හැම අතින් ම අන්සියල්ලන්ට ම වඩා උසස් කොට සැලකීම මෙන් ම අන් අය පහත් කොට සැලකීමයි. මෙය සිත දූෂිත කරන චෛතසිකයක් වන්නේ තමන්ගේ සැබෑ ස්වභාවය නොවැටහීම නිසා සහ අන් අයගේ යථා තත්වයන් නොසලකා ක්‍රියා කිරීම නිසා අනුන් හෙළා දැකීමෙන් සිදුකරන මහත් හානියයි. එසේම තමන්ට ද මහත් හානියක් ඔහු සිදුකර ගනියි. එනම් සමාජයේ හැම දෙනාගේ ම පිළිකුලට මෙම පුද්ගලයා පත්වීමයි. සමානාත්මතා ගුණයෙන් පිරිහීම මෙහි මූලික ලක්ෂණයයි. 'අතිමානී



පුද්ගලයෝ ගරුකළ යුත්තන්ට ගරු නොකිරීමෙනුත්, යටත්විය යුත්තන්ට යටත් නොවීමෙනුත්, ගුරු උපදේශ ගත යුත්තන්ගෙන් ගුරු උපදේශ නොගැනීමෙනුත්, මිත්‍රවිය යුත්තන් හා මිත්‍ර නොවීමෙනුත්, පහත් අයට හිමි වැඩ යැයි නොයෙක් දේ නොකර සිටීමෙනුත් පැමිණිය හැකි දියුණුවෙන් ද පිරිහෙති. පැමිණ සිටි තත්වයෙන් ද පිරිහෙති.'[17]

මෙසේ අතිමානී පුද්ගලයා මෙම චෛතසික නිසා ආධ්‍යාත්මික වශයෙන් ද බාහිර වශයෙන් ද මෙලොව වශයෙන් මෙන්ම පරලොව වශයෙන් ද පිරිහීමට පත්වේ.

3.15 මදය :- මදය නම් මත්වීමයි. මත් ගතිය යනු පියවි සිහියෙන් තොර බවයි. සැබෑ ප්‍රකෘති සිහිය නැති පුද්ගලයා තමා සිදු කරන්නේ කුමක්දැයි හරිහැටි නොදනී. අඩ නින්දේ සිටින කෙනෙකු මෙනි. එසේ මදයෙන් හෙවත් මත් ගතියෙන් යුතු තැනැත්තා විවිධ වූ අහිතකර දෑ සමාජයට සිදු කරයි. පෞද්ගලිකව තමාත්, පොදුවේ සමාජයත් පරිහානියට පත් කරවන බොහෝ වැරදි මෙම චෛතසිකය බලපවත්වන විට සිදුවීම වැළැක්විය නොහැකිය. මදය ප්‍රභේද රාශියකින් යුක්තය. යොබ්බන මදය, ආරෝග්‍ය මදය, ශ්‍රෝත්‍ර මදය, ජාති මදය ආදී වශයෙනි.[18]

3.16 ප්‍රමාදය :- මෙහි ප්‍රමාදය නම් කුසල් දහම්හි සිත් නොඇලවීමයි. පවත්නා ස්වභාවයෙන් සිතට ක්‍රියාකිරීමට ඉඩ අවකාශ සැලසීම ලෙස ද මෙය හඳුන්වා දිය හැකිය. ස්වභාවයෙන් ම සිත ක්‍රියාත්මක වන්නේ අකුසල පාක්ෂිකවය. පෘතජ්ජන ගතිය එයයි. ප්‍රමාද බවෙහි ප්‍රතිඵලය වන්නේ පුද්ගලයා සසරට ම බැඳ තැබීමයි. ප්‍රමාදී බවේ ආදීනව මෙන්ම අප්‍රමාදී බවෙහි ආනිසංස නිරන්තරයෙන් ම බුදු දහම අවධාරණය කරයි. සියලු දේ අනිත්‍ය බැවින් අප්‍රමාදීව කටයුතු කළ යුතු බවත්[19] ප්‍රමාදය නැවත නැවත සසර ඉපදීමට හේතු වන අතර අප්‍රමාදය නිවනට කාරණ වන බවත්[20] අවධාරණය කිරීමෙන් පෙනී යන්නේ අකුසල පක්ෂය මූලෝත්පාඨනය කර කුසලයෙහි සිත පිහිටුවීමේ බරපතල අවශ්‍යතාවයයි.

මේ සඳහා එනම් සිත අප්‍රමාදී බවෙහි පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික මග පෙන්වීම සිදු කරන්නේ මනාව පිහිටි සිත, යෝනිසෝ මනසිකාරය, සත්පුරුෂ ආශ්‍රය - සත්පුරුෂ සේවනය හා ධර්මය ඇසුරු කිරීම හෙවත් සද්ධර්ම සේවනය යන්නයි.

## සමාලෝචනය

4.1 මෙසේ වූ සොළොස් ආකාර ක්ලේෂ ධර්මයන් විවරණය කරමින් වත්ථූපම සූත්‍රය පෙන්වා දෙන්නේ අප්‍රමාදයෙහි අගයයි. වස්ත්‍රයක දූර්වර්ණ බවට හේතුව එම වස්ත්‍රයේ කිළිටු බවයි. පුද්ගලයා දුගතියට පත් කිරීමේ හේතුව ද සිතේ කිළිටි බවයි. කිළිටු වස්ත්‍රය සෝදා පිරිසිදු කර එයින් වර්ණවත් බවක් පැහැපත් බවක් ගන්නාක් මෙන් සිතද පිරිසිදු කර ගැනීමෙන් සුගතගාමීවිය හැකිය. සුගතිය අපේක්ෂා කළ හැකිය. දූර්වර්ණ වස්ත්‍රයට අපි ප්‍රිය නොකරමු. එසේම කෙළෙස් මළින් පිරුණු සිත ද අපට සැපතක් ගෙන නොදේ. මෙම සූත්‍රයෙන් දැක්වෙන පරිදි භික්ෂුවගේ (මෙහි භික්ෂුව යයි විශේෂ කර දක්වා තිබුණද එයින් අදහස් කරන්නේ සමස්තශ්‍රාවක පිරිසයි) කාර්යය වන්නේ රජකයෙකු වස්ත්‍රයෙන් කිලුට ඉවත් කරන්නාක් මෙන් සිතෙන් කෙළෙස් මළ (ඉහත සඳහන් ක්ලේෂ ධර්මයන්) ඉවත් කර සිත පිරිසිදු කිරීමයි.

4.2 බුදු දහමෙහි ප්‍රධාන අරමුණ ද මෙයයි. සත්වයා සසරට බැඳ තබන්නේ, කෙළෙස් නිසාය. සසර නැවත නැවත ඉපදීම සැපතක් නොවේ. එයින් මිදීමට නම් ඉපදීම නවතා දැමිය යුතුය. ඉපදීමට හේතු වන සියලු බැඳීම් සිඳලිය යුතුය. පාපයෙන් අකුසලයෙන් මිදීම පිණිසත්, කුසලයෙහි යෙදීම පිණිසත්, එමගින් දෙලොව ජීවිතය අර්ථවත් කර ගත හැකි ආකාරය පිළිබඳවත් මෙම සූත්‍රය මඟ පෙන්වයි.



## පාදක සටහන්

1 පෙළ සාහිත්‍යයෙහි වත්ථ සූත්‍ර කිහිපයක්ම ඇත.

I ම.නි. 1 මූලපරියාය වර්ගයේ එන 7 වන සූත්‍රය

II අං.නි. තිකනිපාතයේ එන වත්ථෝපම සූත්‍රය

III සං.නි. මහාවග්ග සංයුත්තයේ එන වත්ථ විවේක නිස්සිත සූත්‍රය, වත්ථරාග, විනය සූත්‍රය, වත්ථ අමතෝගධ සූත්‍රය, වත්ථ නිබ්බාන නින්න සූත්‍රය වශයෙනි. මෙහිදී අපගේ අධ්‍යයනයට භාජනය වන්නේ මැදුම් සඟියේ මූල පණ්ණාසකයේ ප්‍රථම භාගයේ මූලපරියාය වර්ගයේ එන වත්ථූපම සූත්‍රයයි.

2 සෙය්‍යථාපි භික්ඛවේ වත්ථං සංකිලිට්ඨං මලග්ගහිතං තමේනං රජකෝ යස්මිං යස්මිං රංගජාතේ උපසංහරෙය්‍ය, යදි නීලකාය, යදි පීතකාය, යදි ලෝහිතකාය, යදි මඤ්ජෙට්ඨකාය, දුරත්තවණ්ණමෙවස්ස, අපරිසුද්ධවණ්ණමෙවස්ස, තං කිස්ස හේතු අපරිසුද්ධත්තා භික්ඛවේ වත්ථස්ස, එවමෙව බෝ භික්ඛවේ චිත්තේ සංකිලිට්ඨේ දුග්ගති පාටිකංඛා.

ම.නි. 1 වත්ථූපම සූත්‍රය බු.ජ.ති. 82 පිට

3 සෙය්‍යථාපි භික්ඛවේ වත්ථං පරිසුද්ධං පරියෝදාතං තමේනං රජකෝ යස්මිං යස්මිං රංගජාතේ උපසංහරෙය්‍ය, යදි නීලකාය, යදි පීතකාය, යදි ලෝහිතකාය, යදි මඤ්ජෙට්ඨකාය, සුරත්තවණ්ණමෙවස්ස, පරිසුද්ධවණ්ණමෙවස්ස, තං කිස්ස හේතු පරිසුද්ධත්තා භික්ඛවේ වත්ථස්ස, එවමෙව බෝ භික්ඛවේ චිත්තේ අසංකිලිට්ඨේ සුගති පාටිකංඛා.

එම 83 පිට.

4 පෙළ බසෙහි 'අපවිත්‍ර කරන', 'කිළිටි කරන' යන තේරුම් ඇති 'කිලේස' යන වදනයි, 'කෙළෙස්' යනුවෙන් සිංහලට පැමිණ ඇත්තේ කිලෙස යනු බුදු දහමෙහි ඉතා වැදගත් වූ පාරිභාෂික වචනයකි. සත්ත්වයාගේ

සාංසාරික පැවැත්මත් එහි අභාවයත් යන දෙක ම සිත හා සම්බන්ධව පවතී. සාංසාරික පැවැත්මෙහි කෙළවරක් දැකිය හැක්කේ කර්ම ශක්තිය දනවන කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන ත්‍රිවිධාකාර තණ්හාව ක්‍ෂය කිරීමෙනි.

සිංහල විශ්වකෝෂය 3 වන කාණ්ඩය 694 පිට.

5 ම.නි. 1, 85 පිට

6 වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං වුච්චති භික්ඛවේ භික්ඛු සිනාතෝ අන්තරේන සිනානේනාති

එම 85 පිට

7 අථ ඛෝ සුන්දරිකභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවෝච. ගච්ඡති පන භවං ගෝතමෝ බාහුකා නදිං සිනායිතුංති

එම 85 පිට

8 පඤ්ඤසම්මතාහි හෝ ගෝතම බාහුකා නදී බහුජනස්ස බාහුකායව පන නදියා, බහුනෝ පාපකං කතං කම්මං පවාහේතීති.

එම

9 *නිච්චම්පි බාලෝ පක්ඛන්තෝ - කණ්හකම්මෝ න සුජ්ඣති*
*කිං සුන්දරිකා කරිස්සති කිං - පයාගෝ කිං බාහුකා නදී*
*වෙරිං කත කිබ්බිසං නරං - නහි නං සෝධයේ පාපකම්මිනං*

එම

10 එවං විමුත්ත චිත්තෝ ඛෝ අග්ගිවෙස්සන භික්ඛු තථාගතංව සක්කරෝති. ගරුකරෝති, මානෙති, පූජේති, බුද්ධෝ සෝ භගවා බෝධයා ධම්මං දේසේති. දන්තෝ සෝ භගවා දමථාය ධම්මං දෙසේති. සන්තෝ සො භගවා සමථාය ධම්මං දේසෙති තිණ්ණෝ සෝ භගවා තරණාය ධම්මං දෙසේති. පරිනිබ්බුතෝ සෝ භගවා පරිනිබ්බානාය ධම්මං දේසේති.

ම.නි. 1 චූලසච්චක සූත්‍රය 558-559 පිටු



11 සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං - එතං බුද්ධාන සාසනං

ඛු.නි. 1 ධම්මපදපාළිය, 72 පිට

12 ම.නි. 1, 91 පිට

13 දූරංගමං එකචරං - අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා

ඛු.නි. 1, 34 පිට

14 මනෝපුබ්බංගමා ධම්මා - මනෝසෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන - භාසතිවා කරෝති වා
තතෝනං දුක්ඛමන්වේති - චක්කංව වහතෝ පදං

එම 26 පිට

15 සන්තුස්සකෝ ච සුභරෝ ච - අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච - අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

ඛු.නි. 1, ඛුද්දකපාඨ 20 පිට

16 ඌනෝ ලෝකෝ අතිත්තෝ තණ්හාදාසො 'ති ඛෝ මහාරාජ තේන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධේන චතුත්ථෝ ධම්මුද්දේසෝ උද්දිට්ඨෝ යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතෝ.

ම.නි. 1, රට්ඨපාල සූත්‍රය, 440 පිට

17 චිත්තෝපක්ලේෂදීපනී, රේරුකානේ චන්දවිමල හිමි, 128 පිට

18 එම

19 අථඛෝ භගවා භික්ඛූ ආමන්තේසි හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථාති

දී.නි. 2, මහාපරිනිබ්බාන සූත්‍රය 244 පිට

20 අප්පමාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝ පදං
අප්පමත්තා නමීයන්ති - යේ පමත්තා යථා මතා

ඛු.නි. 1, ධම්මපාලිය 30 පිට

21 චිත්තෝපක්ලේෂදීපනී, රේරුකානේ චන්දවිමල හිමි, 144 පිට